# මලී



බී.ඒ.එම් ජලනි හර්ෂිතා අත්තනායක

CamScanner

# මලී

බී.ඒ.එම් ජලනි හර්ෂිතා අත්තනායක

**කතෘ**

පළමු දිගහැරීම

මහාමායා බාලිකා විදුහල.මහනුවර

1 ශ්‍රේණිය B

ISBN 978-624-208-963-8



CS CamScanner

# පිදුම

දස මසක් කුස දරා මා මෙළොවට බිහි කළ,ඇඟ ලේ කිරි කර පොවා මා පෝෂණය කළ මා ආදරණීය මෑණියන්ටත්,

හඬන විට ගැලූ කඳුලැල් පිසලමින්,සෙවනැල්ලක් වී ජීවිතයේ අරුත කියා දී මා ආදරයෙන් රැක බලා ගන්නා මා ආදරණීය පියාණන්ටත්,

යහ ගුණ කියා දී මා නිතරම දිරිමත් කරන මා ආදරණීය කිරි අම්මා සහ කිරි අත්තාටත්,

නව ලොවෙහා යනෙන කළ යහමගෙහි යාමට අත්වැල් සැපයූ ආදරණීය ගුරුමෑණියන්ටත් පිරිනමමි සෙනෙහසින් මාගේ මෙම අප්‍රමාණ ව්‍යායාමය.........



# පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සුදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස  දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි.  මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා  සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වූ හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි.  මේ සඳහා නිර්මානකරණයෙන් දායක වු පාසල් දරුවන් මගපෙන්වූ ගුරුභවතුන් ඇතුලු සැමට ස්තුතිය පුදකරමු.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,
ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.
සම්මානිත මහාචාර්ය , පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
2026-05-10



CamScanner

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු  දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමගින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමී.

ප්‍රදීප් නිලංග දැල,
දියවඩන නිලමේ,
ශ්‍රී දළදා මාලිගාව



CamScanner

මලී හරිම ලස්සන පුංචි ළමයෙකි.එයා ලස්සනයි වගේම ගොඩාක් හොඳ ළමයෙක්.පුංචි මලී එයාගේ අම්මාටයි තාත්තාටයි ගොඩාක් ආදරෙයි.නමුත් එයාගේ අම්මායි තාත්තායි මලී පුංචි කාලයේදී ම නැති වුණා.එතැන් පටන් මලී හැදුණේ වැඩුණේ එයාගේ කිරි අම්මාත් එක්ක.කිරි අම්මා ගොඩාක් ආදරෙන් මලීව රැක බලා ගත්තා.පාසලේ වැඩ වලට වගේම ගෙදර වැඩවලටත් පුංචි මලී ගොඩාක් දක්ෂයි.කිරි අම්මාත් එක්ක එකතු වෙලා ගෙදර වැඩ කරන්න පුංචි මලී ගොඩාක් ආසයි.



පුංචි මලීගේ ගෙදර හරිම ලස්සනයි.හරියට පුංචි මාලිගාවක් වගේ.බලන බලන හැම පැත්තේ ම පාට පාට මල්.හරිම ලස්සනයි.පුංචි මලී හරි ආසයි මල් වවන්න.සමන්පිච්ච මල්,රෝස මල්,ඕකිඩ් මල්,වතුසුද්ද මල් වත්තේ හැම තැනම පිපිලා.හරිම සුවඳයි.මේ නිසා සමනලයින් ,මී මැස්සන් වගේ පුංචි පුංචි සත්තු මලීගේ ගෙවත්තට එන්න අමතක කළේ නෑ.



මලී හැමදාම හවසට එයාගේ කිරි අම්මාත් එක්ක බුදුන් වඳින්න අමතක කරේ නෑ.එක දවසක් පුංචි මලී බුදු සාදුට පූජා කරන්න මල් කඩන්න රෝස පඳුර ළඟට ගියා.එදා රෝස පඳුරේ මල් ගොඩාක් පිපිලා.පුංචි මලී හරිම සතුටින් මල් කැඩුවා.

එකපාරටම මලී ගැස්සුණා.

ආහ්! අනේ කවුද මේ?

ලස්සන පුංචි සුරංගනාවියක්ද? හරි පුදුමයි.පුංචි මලී පුදුමෙන් ඒ දෙස බලා සිටියා.



රෝස මලක ලස්සන පුංචි සුරංගනාවියක්.ඇත්තටම ඒ සුරංගනාවියක්ද?පුංචි මලී සතුටින් උඩ පැන පැන කෑ ගැසුවා.

සුරංගනාවි පුංචි මලී ළඟට ආවා.

"ඔයා හොඳ ළමයෙක්. ඒකයි මම ඔයාව බලන්න ආවේ.ඔයා කැමතිද මාත් එක්ක සුරංගනා ලෝකෙට යන්න." සුරංගනාවිය මලීගෙන් ඇසුවා.

සුරංගනා ලෝකය! අනේ මම කවදාවත් දැකලා නෑ සුරංගනා ලෝකය.

එහෙ ගොඩාක් ලස්සන ඇති නේද? සුරංගනාවියෝ ගොඩාක් ඇති නේද?ලස්සන මල්, ලස්සන කුරුල්ලෝ,ලස්සන මාළිගාත් ඇති නේද?



ඒත් මම සුරංගනාවියක් නෙමෙයිනේ.ඉතිං මම කොහොමද සුරංගනා ලෝකෙට යන්නේ? පුංචි මලීගේ ඇස් වලින් කඳුළු කැට වැටෙන්න පටන් ගත්තා.



“අනේ! අඬන්න එපා.මට පුළුවන් ඔයාව ලස්සන පුංචි සුරංගනාවියක් කරන්න. ” සුරංගනාවිය මලීගේ හිස අතගාමින් කිව්වා.

“අනේ! ඇත්තමද? මම සුරංගනාවියක් වෙනවා.” මලීට හරිම සතුටුයි.

එක පාරටම සුරංගනාවිය අහසට පියඹලා ගිහින් එයාගේ අතේ තිබුණ සුරඟන යෂ්ටිය මලීගේ ඔළුවේ තිබ්බා.



පුදුමයක්!

මලී එකපාරටම සුරංගනාවියක් බවට පත් වුණා.

අනේ! මලී සුරංගනාවිය හරිම ලස්සනයි.කහ පාට දිලිසෙන දිග ගවුමක්, ලස්සන සපත්තු,ලස්සන ඔටුන්නක්. මේ ඔක්කොම දේවල් නිසා මලී ගොඩාක් ලස්සනට දිලිසුණා.





CamScanner

ඒත් එක්කම සුරංගනාවියගේ යාළුවෝත් අහසේ ඉදන් මලී සුරංගනාවිය බලන්න ආවා.

“අනේ අපේ සුරංගනා ලෝකයට තවත් ලස්සන පුංචි සුරංගනාවියක්” සුරංගනාවියෝ සතුටින් කෑ ගැසුවා.



“ඔයා කැමතිද අපිත් එක්ක සුරංගනා ලෝකයට යන්න.”එතන හිටිය කොළ පාට ගවුමක් ඇඳ සිටි සුරංගනාවියක් මලීගෙන් ඇසුවා.

“ම්ම්හ්හ්..... ඔව් මම කැමතියි.එතකොට මට ඔයාලත් එක්ක සෙල්ලම් කරන්නත් පුළුවන්.”මලී කිව්වා.

සුරංගනාවියන්ටත් හරිම සතුටුයි.එයාලා ඔක්කෝම අත් අල්ලාගෙන දේදුන්න දිගේ සුරංගනා ලෝකයට පියඹලා ගියා.



“දුවේ! දුවේ! නැගිටින්න නැගිටින්න, ඉස්කෝලේ යන්න.”කිරි අම්මාගේ කට හඬ ඇසුණු මලී ගැස්සී ඇහැරුණා.

අනේ! මම දැකලා තියෙන්නේ හීනයක්ද?මලී දුවගෙන ගොස් කිරි අම්මාට එයා දැකපු හීනය කිව්වා.

“මගේ දුවත් මේ ලෝකයේ ඉන්න හොඳ ලස්සන සුරංගනාවියක්.”හොඳ ගුණ යහපත් ඇති හොඳ ළමයින්ට මේ ලොව ලස්සන කරන්න පුළුවන් බව කිරි අම්මා මලීට කියලා දුන්නා.





# පසුවදන

අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම්පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නුතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දූරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මුලිකත්වයෙන් හේමමාලා උපහාරv ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබළ ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැකවීම ද මෙහි මුලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුලු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තුතිවන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්

( ව්‍යාපෘති නිර්මාතෘ)

ISBN 978-624-208-963-8



CS CamScanner